සියළුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Resevd

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
# Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය - 2018 මාර්තු** — **10 ශ්‍රේණිය**
**முதலாம் தவணைப் பரீட்சை 2018 மார்ச்** — **தரம் - 10**
**First Term Test – 2018 March** — **Grade - 10**

**ගණිතය I**
**கணிதம் I**
**Mathematics I**

**පැය දෙකයි**
**2 மணித்தியாலம**
**2 Hours**

## A - කොටස

| | | |
|---|---|---|
| A | 1 - 25 | |
| B | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| මුළු ලකුණු | | |

■ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.**


**01.** $\sqrt{46}$ හි අගය පිහිටන්නේ කුමන අනුයාත පූර්ණ සංඛ්‍යා දෙක අතරද?

**02.** සිසුන් 600 ක් සිටින පාසලක $\frac{2}{3}$ ක් පිරිමි ළමුන් වෙති. ගැහැනු ළමයින් ගණන කොපමණද?


**03.** $a^2 + 4a - 5$ ත්‍රිපද වර්ගජ ප්‍රකාශනයේ, එක් සාධකයක් $(a + 5)$ වේ. අනෙක් සාධකය සොයන්න.

www.mathsland.org

**04.** අරය 21 cm ක් වූ කේන්ද්‍රික ඛණ්ඩයක් පහත දැක්වේ. එහි පරිමිතිය සොයන්න.





**05.** පහත දැක්වෙන ත්‍රිකෝණ යුගලය තවත් එක් අංග යුගලයක් සමාන කිරීමෙන් අංගසම කළ හැකි නම් එම සමාන කළ යුතු අංග යුගලය ලියා, ඊට ගැළපෙන අංගසම අවස්ථාව ද ලියන්න.



**06.** $\sqrt{12}$ හි අගය වඩාත් ආසන්න වන්නේ පහත දැක්වෙන අගයයන් අතරින් කුමන අගයටද?

**(i)** 3.3  **(ii)** 3.4  **(iii)** 3.5

**07.** පහත දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ දී ඇති දත්ත අනුව වර්ගඵලය සොයන්න.





**08.** සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

$$(2y+5)^2 = (2y)^2 + 2x \ldots\ldots \times 5 + 5^2$$
$$= \ldots\ldots\ldots\ldots + 20y + 25$$

**09.** $3xy$ , $6x^2$ , $12y^2$ යන වීජීය පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

**10.** මිනිසුන් 12 දෙනෙකුට වත්තක් සුද්ද කිරීමට දින 4 ක් ගත වේ යැයි ඇස්තමේන්තු කර ඇත. මිනිසුන් 16 දෙනෙක් එම කාර්යය සඳහා සම්බන්ධ කර ගත්තේ නම් ඒ සඳහා ගත වූ දින ගණන සොයන්න.


**11.** පහත දී ඇති ත්‍රිකෝණ අතරින් ABC ත්‍රිකෝණයට අංගසම වන ත්‍රිකෝණය නම් කර එමගින් BC පාදයට අනුරූප පාදය ලියා දක්වන්න.





**12.** $x^2 + Ax - 24 = (x+8)(x+B)$ නම් A හා B හි අගය සොයන්න.

www.mathsland.org


**13.** දී ඇති තොරතුරු ඇසුරින් මෙම රූපයේ $x^\circ$ හි අගය සොයන්න.




**14.** O කේන්ද්‍රය වූ වෘත්තයේ අඳුරු කළ කොටසේ වර්ගඵලය 35 $cm^2$ ක් වේ නම් ඉවත් කළ කොටසේ වර්ගඵලය සොයන්න.




**15.** රූපයේ දී ඇති තොරතුරු අනුව $x^\circ$ හි අගය සොයන්න.





**16.** හිස්තැන් පුරවන්න.

$$98^2 = (100 - 2)^2$$
$$= 100^2 - 2\times - \ldots\ldots \times 2 + 2^2$$
$$= \ldots\ldots\ldots$$

www.mathsland.org


**17.** මිනිස් දින 30 කින් නිම කළ හැකි කාර්යයක් සේවකයින් පිරිසක් විසින් දින 5 කින් නිම කරයි. සේවකයින්ගේ මුළු වැටුප රු. 36 000 ක් නම් එක් සේවකයෙක් සඳහා ගෙවන ලද වැටුප කොපමණද?

**18.** රූපයේ දැක්වෙන තොරතුරු අනුව ABC ත්‍රිකෝණයේ සමාන පාද යුගලයක් ලියා දක්වන්න.




**19.** අරය මීටර් 7 ක් වූ අර්ධ වෘත්තාකාර පොකුණක් වටා සුදු යකඩ අත්වැටක් සවි කර ඇත්නම් වැටේ දිග සොයන්න.

**20.** ABCD සෘජුකෝණාස්‍රයක් ද BEC සමද්විපාද ත්‍රිකෝණයක් ද නම්, $A\hat{B}E$ කෝණයෙහි අගය සොයන්න.




**21.** ශිෂ්‍යයෙකු විසින් විජීය පද දෙකක කුඩා පොදු ගුණාකාරය ප්‍රථමක සාධක ඇසුරෙන් සෙවීමට උත්සාහ කළ ආකාරය පහත දැක්වේ. හිස්තැන් සම්පූර්ණ කරන්න.

$5p^2 \quad = \quad 5 \times p^2$

.......q $=$ ...... $\times$ ...... $\times$ q

කු.පො.ගු.$=$ 30 .......


**22.** දී ඇති රූපයේ a කෝණයේ අගය b, c හා d ඇසුරින් දක්වන්න.





**23.** හුසේන් තමා සතු හෙක්ටයාර් 10 ක් වන ඉඩම දියණියන් හතර දෙනාට සහ පුතාට සමසේ බෙදා දෙන ලදී. පුතා ඔහු සතු ඉඩමෙන් $\frac{3}{4}$ ක් කුරුඳු වගා කළේ නම් කුරුඳු වගා කළ ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කීයද?

www.mathsland.org

**24.** ඉහත දැක්වෙන ABCD ත්‍රැපීසියමේ AE = DE = FC වේ. $B\hat{C}F$ කෝණයෙහි අගය සොයන්න.




**25.** 10 ශ්‍රේණියේ සිසුන් 60 ක් සිටින පාසලක එම සිසුන් අතරින් සෞන්දර්ය විෂයයන් හදාරණ සිසුන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වට ප්‍රස්තාරයෙන් දැක්වේ.




සිසුන් 15 දෙනෙක් පෙරදිග සංගීතය හදාරන්නේ නම් ඔවුන් නිරූපණය කෙරෙන කේන්ද්‍රික ඛණ්ඩයේ අක්ෂරය ලියන්න.

## B - කොටස

01. සිතුම් තම මාසික ආදායමින් $\frac{1}{8}$ ක් ගමන් වියදම් සඳහා ද ඉතිරියෙන් $\frac{2}{7}$ ක් ආහාර සඳහා ද වෙන් කරයි.

(i) ඔහු ආහාර සඳහා වියදම් කරන මුදල මුළු ආදායමෙන් කවර කොටසක්ද?

(ii) ආහාර සහ ගමන් වියදම් සඳහා වැය කරන මුදල මුළු ආදායමින් කවර කොටසක්ද?


(iii) ඔහු ආහාර සහ ගමන් වියදම් සඳහා වියදම් කළ පසු ඉතිරි කොටසින් $\frac{1}{10}$ ක් ඉතිරි කරන අතර එය රු. 3000 කි.සිතුම්ගේ මුළු ආදායම කොපමණද?

(iv) ආහාර ගමන් වියදම් සහ ඉතිරි කිරීම්වලට ද දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට ද වියදම් වන මුළු වියදම රු. 25 000/= ක් නම් අධ්‍යාපන කටයුතු සඳහා වැය වන්නේ මුළු ආදායමින් කවර කොටසක්ද?

www.mathsland.org

02. (a) $\sqrt{20}$ සඳහා වඩාත් ම ආසන්න අගය වන්නේ 4.4 නොව 4.5 බව පෙන්වන්න.

**(b)** ගණිත ක්‍රියාකාරකමක් සඳහා විශ්වා ගුරුතුමිය විසින් සාදන ලද පුවරුවක් ඉහත දැක්වේ. සමචතුරස්‍රාකාර කාඩ්බෝඩ් කැබැල්ලකින් වර්ගඵලය $14\ cm^2$ බැගින් වූ A හා B සමචතුරස්‍රාකාර කොටස් දෙකක් ඉවත් කිරීමෙන් එය නිමවා ඇත.




**(i)** A සිදුරේ පැත්තක දිග පළමු දශමස්ථානයට සොයන්න.

**(ii)** රූපයේ අඳුරු කර ඇති පෙදෙසේ වර්ගඵලය $41\ cm^2$ ක් නම් කාඩ්බෝඩ් කැබැල්ලේ පැත්තක දිග පළමු දශමස්ථානයට සොයන්න.

**(iii)** වර්ගඵලය $100\ cm^2$ ක් වූ සමචතුරස්‍රාකාර තෙල් කඩදාසියක් ඉහත කාඩ්බෝඩ් කැබැල්ලේ අලවා ඇත්තේ තෙල් කඩදාසියේ එක් ශීර්ෂයක් හා ඊට යාබද දාර දෙක කාඩ්බෝඩ් කැබැල්ලේ ශීර්ෂයක් සහ ඊට යාබද දාර දෙක මත සමපාත වන සේය. තොරතුරුවලට අදාළව මිනුම් සහිත දළ රූප සටහනක් ඉහත රූපය මත ඇඳ දක්වන්න.

www.mathsland.org

**03.** නිරෝගයා පෞද්ගලික රෝහලේ උදෑසන පවිත්‍රතා කටයුතු පෙ.ව. 6.00 ට ආරම්භ කර පෙ.ව. 10.00 වන විට අවසන් කළ යුතුව ඇත. මේ සඳහා සෑම උදෑසනකම සේවකයින් 12 දෙනෙක් යොදවා ගනී.


**(i)** සියලුම සේවකයින් එක්ව කරනු ලබන වැඩ ප්‍රමාණය මිනිස් පැය කීයද?

**(ii)** එක්තරා දිනක සේවකයින් 4 දෙනෙකු අසනීප වීම නිසා නොපැමිණියේ එම වැඩ ප්‍රමාණය නිම කිරීම සඳහා ඉතිරි සේවකයින්ට ගත වන පැය ගණන කොපමණද?

**(iii)** උදෑසන 10.00 වන විට පවිත්‍රතා කටයුතු අවසන් කළ යුතු බැවින් ඔවුන් 8 දෙනා එදින සේවය ආරම්භ කළ යුතු වේලාව කීයද?

**(iv)** වැඩිපුර වැඩ කරන සෑම පැයකටම එක් අයෙකුට රු. 200 ක අමතර දීමනාවක් ගෙවන බැවින් එදින එම සේවකයින් 8 දෙනාට අමතරව ගෙවූ මුදල සොයන්න.

**04.** රූපයේ දක්වෙන්නේ ආගමික සිද්ධස්ථානයක සවිකර තිබූ ගේට්ටු පියනක රූප සටහනකි. ඇලුමිනියම් තහඩුවලින් සකස් කර ඇති ගේට්ටු පියන මධ්‍යයේ අරය 14 cm ක් වූ වෘත්තාකාර කොටසක් ඉවත් කර එයට යකඩ පටිවලින් සාදන ලද මෝස්තරයක් සවිකර ඇත.




**(i)** ගේට්ටු පියනේ ඉහළින් පිහිටි අර්ධ වෘත්තාකාර කොටසේ දිග සොයන්න.

**(ii)** ගේට්ටු පියනේ පරිමිතිය මැද පිහිටි වෘත්තයේ පරිධියට වඩා කොපමණ වැඩිද?


**(iii)** ගේට්ටුවට ඉහළින් ඇති අර්ධ වෘත්තාකාර කොටසේ වර්ගඵලය සොයන්න.

**(iv)** ගේට්ටුව සකස් කිරීමට වැය වූ තහඩුවල වර්ගඵලය සොයන්න.



www.mathsland.org

**05.** එක්තරා පාසලක නිවාසාන්තර මළල ක්‍රීඩා උළෙලකදී එක් එක් නිවාසය ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව පහත වට ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.




**(i)** නිල්වලා නිවාසයේ මුළු ලකුණු ප්‍රමාණය දැක්වෙන කේන්ද්‍ර කෝණයේ අගය සොයන්න.

**(ii)** සමනල නිවාසය ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව 336 ක් නම් ජයග්‍රහනය කළ නිවාසය ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව කොපමණද?

**(iii)** මහවැලි නිවාසය ලබාගත් මුළු ලකුණුවලින් $\frac{1}{4}$ ක් ද සමනල නිවාසය ලබාගත් මුළු ලකුණුවලින් $\frac{1}{3}$ ක් ද ලබා ගත්තේ කණ්ඩායම් තරග සඳහා නම් එම නිවාස දෙක කණ්ඩායම් තරග සඳහා ලබාගත් ලකුණු අතර සම්බන්ධතාවක් ගොඩනගන්න.

**(iv)** ලකුණු සැකසීමේදී සිදු වූ වැරැද්දක් නිසා නිල්වලා නිවාසයේ ලකුණු 56 ක් සමනළ නිවාසයට එකතු කළ යුතුය. එසේ සංශෝධනය වූ පසු සකස් කළ වට ප්‍රස්තාරයේ දත්ත සහිත අසම්පූර්ණ වගුවක් පහත දැක්වේ.

එම වගුවේ හිස්තැන් පුරවන්න.

| | සමනළ | නිල්වලා | මහවැලි |
|---|---|---|---|
| කේන්ද්‍ර කෝණය | ......................... | ......................... | 120° |
| මුළු ලකුණු | ......................... | 504 | 448 |

****

www.mathsland.org

සියළුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reseved

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
# Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය - 2018 මාර්තු** — **10 ශ්‍රේණිය**
**முதலாம் தவணைப் பரீட்சை 2018 மார்ச்** — **தரம் - 10**
**First Term Test – 2018 March** — **Grade - 10**

**ගණිතය II**
**கணிதம் II**
**Mathematics II**

**පැය තුනයි**
**3 மணித்தியாலம்**
**3 Hours**

- ♦ **A කොටසින් ප්‍රශ්න 5 කුත්, B කොටසින් ප්‍රශ්න 5 කුත් ලෙස ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.**
- ♦ **සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 ක් හිමි වේ.**

## A - කොටස

**01.** ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා භාරගත් කොන්ත්‍රාත්කරුවෙකු එහි බිම සකස් කිරීම සඳහා මිනිසුන් 5 දෙනෙකුට දින 30 ක් ගත වන බව ඇස්තමේන්තු කරයි.

**(i)** ඇස්තමේන්තුවට අනුව බිම සකස් කිරීම සඳහා වැය වන මුළු මිනිස් දින ගණන කීයද?

**(ii)** මිනිසුන් 5 දෙනෙකු දින 10 ක් වැඩ කළ පසු මිනිසුන් තිදෙනෙක් එතනින් ඉවත් කර වෙනත් කාර්යයකට යොදවන ලදී.
ඉතිරි මිනිසුන් දෙදෙනාට වැඩය නිම කිරීම සඳහා ගත වන දින ගණන කීයද?


**(iii)** බිම සකස් කිරීම සඳහා ඇස්තමේන්තු ගත කාලය මෙන් දෙගුණයක් කාලය ගත වී ඇති බවට ගොඩනැගිලි හිමියා චෝදනා කර සිටියි. ඔහුගේ චෝදනාව සාධාරණ වේද නොවේද යන්න ගණනය මඟින් තහවුරු කරන්න.

**(iv)** මිනිසුන් පස් දෙනා එකතුව කළ වැඩ කොටස සහ ඉතිරි දෙදෙනා කළ වැඩ කොටස අතර වෙනස මුළු වැඩ ප්‍රමාණයෙන් $\frac{1}{3}$ ක් බව පෙන්වන්න.

www.mathsland.org

**02. (a)** $(2x + 3)(3x + 2)$ සුළු කර දක්වන්න.

**(b)**




A, B හා C යනු තුනී වීදුරු තහඩු 3 කි. එහි A හා B සමචතුරස්‍රාකාර වන අතර C සෘජුකෝණාස්‍රාකාර වේ.

**(i)** B හි පැත්තක දිග A හි පැත්තක දිගෙහි දෙගුණයට වඩා ඒකක එකක් අඩු ය. A හි පැත්තක දිග ඒකක x නම්, x ඇසුරින් B හි වර්ගඵලය සඳහා ප්‍රකාශනයක් ගොඩනගා සුළුකර දක්වන්න.

**(ii)** C හි දිග A හි පැත්තක දිගට වඩා ඒකක 9 ක් වැඩිවන අතර C හි පළල A හි පැත්තක දිගට වඩා ඒකක 1 කින් වැඩිය. C හි වර්ගඵලය x හි වර්ගජ ප්‍රකාශනයක් ලෙස දක්වන්න.


**(iii)** x හි අගය ඒකක 4 ක් වන විට සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සමචතුරස්‍ර දෙකෙහි වර්ගඵලයන්ගේ එකතුවට සමාන බව පෙන්වන්න.

**03.** **(i)** $2x^2 + 3x$ හි සාධක සොයන්න.

**(ii)** $x^2 + 3x - 28$ හි සාධක සොයන්න.


**(iii)** $35^2 - 25^2$ සාධක දනුම ඇසුරින් අගය සොයන්න.

**(iv)** පැත්තක දිග ඒකක $3x$ වන සමචතුරස්‍ර තහඩුවකින් පැත්තක දිග ඒකක $2y$ වන සමචතුරස්‍ර තහඩු කොටසක් කපා ඉවත් කර ඇති ආකාරය රූප සටහනේ දක්වා ඇත. එහි අඳුරු කළ කොටසේ වර්ගඵලය වීජීය ප්‍රකාශනයකින් ලියන්න. එම ප්‍රකාශනයේ සාධක සොයන්න.




**04.** PQR සෘජුකෝණික ත්‍රිකෝණ කොටසක් හා QR විෂ්කම්භයක් වූ අර්ධ වෘත්තාකාර කොටසකින් සමන්විත සංයුක්ත තල රූපයක් මෙහි දක්වේ.

PQ හි දිග 3r වන අතර OR හි දිග 2r වන සේ $P\hat{Q}R$ සෘජුකෝණය දෙපස පාද පිහිටයි. $\pi$ හා r ඇසුරින් ත්‍රිකෝණයේ හා අර්ධ වෘත්තයේ වර්ගඵලයන් සොයා සංයුක්ත රූපයේ වර්ගඵලය A නම් A හි අගය $\pi$ හා r ඇසුරින් ගොඩනගන්න. එමගින් $\pi = \frac{22}{7}$ භාවිතා කරමින් අර්ධ වෘත්තයේ අරය $\sqrt{\frac{7A}{32}}$ බව පෙන්වන්න.




**05.** **(a)** පහත වීජීය ප්‍රකාශනවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

**(i)** $24, 8y, 10y^2$


**(ii)** $x^2 - a^2$, $x^2 - 2ax + a^2$, $x^2 - ax$

**(b)** චමල්ට උණ රෝගය සඳහා බීමට ලබා දී ඇති A, B හා C බෙහෙත් පෙති වර්ග තුනකි. ඔහු A බෙහෙත් පෙත්ත පැය $(6x + 3)$ කට වරක් ද B බෙහෙත් පෙත්ත පැය $8(2x + 1)^2$ කට වරක් ද C බෙහෙත් පෙත්ත පැය 3 කට වරක් ද පානය කරයි. පළමු වතාවේදී ඔහු මෙම බෙහෙත් පෙති තුනම එකවර පානය කරන ලද අතර නැවත වතාවක් මෙම බෙහෙත් පෙති වර්ග තුනම එකවර පානය කරන්නට සිදුවන්නේ කුමන කාලයකට පසුද? පිළිතුර වීජීය ප්‍රකාශනයකින් දක්වන්න.

**06.** **(i)** $(a + 5)(a - 3)$ ප්‍රසාරණය කර දක්වන්න.

www.mathsland.org

**(ii)**





දී ඇති සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය $x^2 - 5x + 6$ වේ. එහි දිග a සහ පළල b නම් a සහ b සඳහා ප්‍රකාශන දෙකක් ලියන්න.

**(iii)** ඉහත සෘජුකෝණාස්‍රයේ පළල ඒකක එකකින් වැඩි කළ පසු ලැබෙන්නේ සමචතුරස්‍රයක් බව හේතු දක්වමින් පැහැදිලි කරන්න.

**(iv)** $x^2 - 4$ හා $(x - 2)(x + 3)$ හි කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

## B - කොටස

**07.** ABC ත්‍රිකෝණයේ BAC කෝණයෙහි සමච්ඡේදකය BC පාදය E හිදී හමු වේ:




www.mathsland.org


**(i)** $A\hat{B}E + A\hat{E}B = A\hat{C}E + A\hat{E}C$ බව සාධනය කරන්න.

**(ii)** BC පාදය D දක්වා දික් කරනු ලබන්නේ නම්,

$A\hat{B}C = A\hat{C}D - 2B\hat{A}E$ බව සාධනය කරන්න.

---

**08.** රූපයේ දක්වෙන්නේ සැරසිලි කටයුත්තක් සඳහා සකස් කරන ලද කම්බි සැකිල්ලකි. පැත්තක දිග 21 cm ක් වන සමචතුරස්‍රාකාර කොටසක් හා එහි පාද මත පිහිටන කේන්ද්‍ර කෝණය 60° වන කේන්ද්‍රික ඛණ්ඩ 4 කින් සමන්විත වන සේ එය නිමවා ඇත. සැකිල්ල ශක්තිමත් වීම සඳහා එකිනෙකට ලම්බක කම්බි කූරු දෙකක් රූපයේ දක්වෙන පරිදි සමචතුරස්‍රාකාර කොටස මැදට සවි කර ඇත.




**(i)** සම්පූර්ණ කම්බි රාමුවේ පරිමිතිය සොයන්න.

**(ii)** සම්පූර්ණ කම්බි රාමුව සෑදීම සඳහා වැයවන කම්බිවල දිග ගණනය කරන්න.


**(iii)** එම සැකිල්ලේ පරිමිතිය මත 2 cm ක් පරතරය වන සේ කුඩා කඩදාසි මල් සවි කළ යුතුය. අවශ්‍ය කරන කඩදාසි මල් ගණන 90 ට අඩු වන බව ගණනය මඟින් තහවුරු කරන්න.

**(iv)** කම්බි රාමුව සැකසීම සඳහා රු. 2 500/= ක් ද එක් කඩදාසි මලක් සෑදීම සහ සවි කිරීම සඳහා රු. 15 බැගින් ද වැය වේ නම් එක් සැරසිලි රාමුවක් සෑදීමට වැය වන මුදල සොයන්න.

---

**09.** ABC ත්‍රිකෝණයේ AB = BC හා $A\hat{B}C = 90°$ වේ.

B හරහා ඇඳි සරල රේඛාවට AP හා CQ ලම්බ ඇඳ ඇත.




**(i)** ඉහත රූපය පිටපත් කරගෙන දී ඇති දත්ත ලකුණු කර දක්වන්න.

**(ii)** $B\hat{C}A$ කෝණයෙහි අගය සොයන්න.

**(iii)** $B\hat{C}Q = P\hat{B}A$ බව පෙන්වන්න.

**(iv)** ABP හා BCQ ත්‍රිකෝණ අංගසම බව සාධනය කරන්න.

**10.** ABCD චතුරස්‍රයේ AB හා AD පාද පිළිවෙළින් P හා Q දක්වා දික් කර ඇත.
BD යා කර ඇති අතර $AB = AD$ ද,
$P\hat{B}C = Q\hat{D}C$ ද වේ. මෙම තොරතුරු රූප සටහනකින් දක්වා $BC = DC$ බව සාධනය කරන්න.

---


**11.** ABCD චතුරස්‍රයේ AC හා BD රේඛා T හිදී ඡේදනය වේ.

**(i)** $AB = DC$ හා $AC = BD$ නම් ABD ත්‍රිකෝණය හා ACD ත්‍රිකෝණය අංගසම වන බව සාධනය කරන්න.

**(ii)** $B\hat{A}D = C\hat{D}A$ බව සාධනය කරන්න.


**(iii)** $D\hat{A}T = A\hat{D}T$ බව සාධනය කරන්න.

**(iv)** $BT = TC$ බව සාධනය කරන්න.





---

**12. (a) (i)** a හි අගය සොයන්න.





**(ii)** a, b හා c හි අගයන් සොයන්න.




www.mathsland.org

**(b)** ABCD චතුරස්‍රයේ AB//DC වේ.
ABC කෝණය හා $B\hat{C}D$ කෝණයෙහි කෝණ සමච්ඡේදක O හිදී හමුවේ. $B\hat{O}C = 90°$ බව පෙන්වන්න.




****